C
329.9548
SUR

# ශ්‍රී ලාංකේය දේශපාලනයේ ආගමික දෘෂ්ටිය: ජාතික හෙළ උරුමය පක්ෂයේ දේශපාලන භූමිකාව

# The Religious Ideology in Sri Lankan Politics: The Political Role of *Jātika Hela Urumaya* (JHU)

**විශාඛා එස්. සූරියබණ්ඩාර**

University of Peradeniya
21 JUN 2011
Library

මෙම ස්වාධීන නිබන්ධනය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති
උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.

648569

# සාරාංශය

මෙම අධ්‍යයනයේ තේමාව වන්නේ 2004 පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී ජාතික හෙළ උරුමයේ සාර්ථකත්වය මගින් ප්‍රතිෂ්ඨාපනය වූ පරිදි සිංහල බෞද්ධ වාර්ගික ජාතිකවාදයේ අධිකාරීවාදී ප්‍රවනතාවක් පැනනැගීමය. මෙම අධ්‍යයනයේදි තර්ක කරන පරිදි මෙම සුවිශේෂි දේශපාලන ප්‍රවනතාව විශේෂයෙන් ම කොළඹ, කලුතර, ගම්පහ සහ මහනුවර දිස්ත්‍රික්ක තුළ ඇතැම් නාගරික සහ අර්ධ නාගරික සමාජ තීරු ධනවාදීකරණයට සහ වාණිජ්‍ය කරණයට ලක්වීමේ පසුබිම තුළ පැනනැගුණු නව මධ්‍යම පන්තියක දෘෂ්ටිවාදීමය ප්‍රකාශමාන වීමක් ලෙස සබුද්ධිකකරණය කරණය කර ගත හැකිය. ජාතික හෙළ උරුමය වාර්ගික සහ ආගමික ජාත්‍යෝන්මාදවාදය, රැඩිකල් කරණය කිරීමෙන් සහ පශ්චාත් යටත් විජිත දේශපාලනය වාර්ගික හා ආගමික ලෙස ප්‍රතිඅර්ථකථනයට ලක් කිරීමෙන් හෙජමොනික් සිංහල බෞද්ධ ජාතිකවාදයේ හැරවුම් ලක්ෂයක් සටහන් කළ ආකෘතිය හඳුනාගත හැකි බවයි.

ඉහත ප්‍රපඤ්චය අධ්‍යයනය පුරාම විග්‍රහ කරනු ලබන්නේ එය ශ්‍රී ලංකාවේ පශ්චාත් යටත් විජිත රාජ්‍යය ගොඩ නැගීමේ සහ ජාතිය ගොඩනැගීමේ ගැටලු තුළ ස්ථානගත කිරීම මගිනි. ශ්‍රී ලංකාවේ පශ්චාත් යටත් විජිත රාජ්‍යය ගොඩනැගීමේ ක්‍රියාවලියේ ප්‍රධාන ගැටලුවක් වූයේ රාජ්‍යයේ නූතන ව්‍යවස්ථාමය සහ ආයතනික සැකැස්ම ස්වදේශීය වාර්ගික, ආගමික සහ ප්‍රජාමූලවාදී දෘෂ්ඨීවාදයන් හා භාවිතාවන් ප්‍රතිෂ්ඨාපනය වීමකි. වාර්ගික ජාතිවාදයේ හෙජමොනික් ආකෘතීන්ගේ බලපෑම යටතේ රාජ්‍යය ප්‍රතිසංස්කරණයට ලක්වීමත්ය. පශ්චාත් යටත් විජිත ජාතිය ගොඩනැගීමේ ක්‍රියාවලිය තුළ සුලු ජන වාර්ගික සහ ආගමික අනන්‍යතා ''රාජ්‍ය ජාතික වාදයට'' ප්‍රජාතාන්ත්‍රික ලෙස ඒකාබද්ධ කරනු නොලැබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සිංහල සහ දෙමළ ජාතික වාදයන්ගේ පස මිතුරු ධ්‍රැවයන් වටා ප්‍රධාන ''පරිකල්පිත ප්‍රජාවන්'' දෙකක් ගොඩනැගුණි.

මෙම අධ්‍යයනයේ දී ජාතික හෙළ උරුමය පැන නැගීමට අදාළ සුවිශේෂ ඓතිහාසික හා දේශපාලන පරිස්ථිතිය ප්‍රධාන තේමාවන් කිහිපයක් යටතේ විශ්ලේෂණයට ලක් කෙරේ; එනම් නව ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරණ වල පසුබිම යටතේ 1980 දශකයේ පටන් සිදු වූ දේශපාලන ආර්ථික පරිවර්තනය විසි එක් වන සියවසේ පළමු දශකයේ ලංකාවේ පැවැති දේශපාලන - දෘෂ්ටිවාදීමය සන්දර්භය සහ ඉහත තත්ත්වයන්ට ප්‍රතිචාරාත්මක ලෙස ජාතික හෙළ උරුමය විසින් කරනු ලැබූ සුවිශේෂී උපායමාර්ගික තෝරාගැනීම් යන තේමාවයි. අධ්‍යයනයේ ප්‍රධාන අවධාරණයක් වන්නේ

ජාතික හෙළ උරුමය විසින් ජාතිය ගොඩ නැගීම සම්බන්ධයෙන් දරන ලද වාර්ගික බැහැර කිරීම් වාදී අවස්ථාවන්ය. සිංහල- බෞද්ධ වාර්ගික අනන්‍යතා දේශපාලනය රැඩිකල්කරණය කිරීම සහ ජාතික හෙළ උරුමය විසින් නියෝජනය කළ හෙජමොනික වාර්ගික - ජාතිකවාදයේ අධිකාරීවාදී ප්‍රවණතාවේ ප්‍රතිඵලයක් ලෙස ලාංකීය රාජ්‍ය සහ ආගම අතර සම්බන්ධතාව ප්‍රති අර්ථකථනයට ලක්වීමය.

මෙම සමස්ත විශ්ලේෂණය පුරා දිවයන අවධාරණාත්මක තර්කය වනුයේ ජාතික හෙළ උරුමය යනු නව ලිබරල් ගෝලීයකරණයට පෙර යුගය තුළ ඇති වූ ඇතැම් නිශ්චිත දේශපාලන- ආර්ථික සහ දේශපාලන - දෘෂ්ටිවාදී වෙනස්කම්වල පසුබිම තුළ පැනනැගිය හැකි වූ සිංහල බෞද්ධ වාර්ගික ජාතිකවාදයේ අධිකාරීවාදීමය ප්‍රවණතාවක් බවය.

# ABSTRACT

The theme of this study is the emergence of an authoritarian tendency of Sinhalese Buddhist ethno-nationalism as it was reflected in the success of the *Jathika Hela Urumaya* (JHU) at the parliamentary general election in 2004. The study argues that this particular political trend can be rationalized as an ideological manifestation of a newly emerged middle class that which was emerged against the background of the process of capitalization and commercialization in some urban and semi-urban social landscapes, especially in Colombo, Kalutara, Gampaha and Kandy districts. The JHU marked a significant turning point in the hegemonic Sinhalese Buddhist nationalism by radicalizing ethnic and religious chauvinism and reinterpreting postcolonial politics in ethnic and religious terms.

The above mentioned phenomenon is analyzed throughout this study by situating it within the problems of postcolonial state building and nation building in Sri Lanka. One of the main problems in the process of post-colonial state building in Sri Lanka was the reinforcement of indigenous ethnic, religious and other communitarian ideologies and practices within the modern institutional and constitutional formation of the state and restructuring the state itself under the influence of the hegemonic forms of ethno-nationalism. In the process of postcolonial nation building, the minority ethnic and religious identities were not democratically integrated into the state nationalism and as a result, two main 'imaginary communities' were emerged around the antagonistic poles of Sinhalese and Tamil ethno-nationalism (s).

The specific historic and political conjuncture of the emergence of the JHU is analyzed in this study under few themes, namely the political-economic transformation occurred since the 1980s against the background of neo-liberal economic reforms, the politico-ideological context in the first decade of the Twenty first century, and particular strategic choices made by the JHU in responding the above conditions. The main emphases of the study are the ethnic exclusionist standpoint of nation building maintained by the JHU, radicalization of Sinhalese-Buddhist ethnic identity politics, and reinterpreting the relationship between religion and state as consequences of the authoritarian tendency of hegemonic ethno-nationalism represented by the JHU. The underline argument throughout this whole analysis is that the JHU is an authoritarian trend of Sinhalese-Buddhist ethno-nationalism which was possible against the background of certain particular political-economic and politico-ideological changes that were occurred in the era of neo-liberal globalization.